**ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 21 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 603.18 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 360.06 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 243.12 ක් හෙවත් සියයට 40.31 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 255.18 | 248.53 | 6.65 | 2.61 |
| මූලධන | 348.00 | 111.53 | 236.47 | 67.95 |
| **එකතුව** | **603.18** | **360.06** | **243.12** | **40.31** |

2.2 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 12.70 | 11.50 | 7.69 | 10.37 | 55.00 | 31.70 |

2.3 **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0132/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 14.8 ක් විය.

2.4 **පොදු තැන්පත් ගිණුම්**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 9.85 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0001/0112/000 | 0.25 |
| 6000/0000/00/0002/0156/000 | 0.03 |
| 6000/0000/00/0013/0109/000 | 1.18 |
| 6000/0000/00/0016/0100/000 | 8.39 |
| **එකතුව** | **9.85** |

2.5 **විගණන නිරීක්ෂණය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**-----------------------------------------------**

**3.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| | ------------------ | ------------------- |
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ii) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (iii) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

**3.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------------**

විෂය අංක 30401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව එහි ආකෘතිය පරිදි වර්ෂයේ සංශෝධිත සීමාවන් විසර්ජන පනතින් බලය දී තිබුණු සීමාවන් යටතේ දක්වා තිබුණි. ඒ අනුව විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් සැසඳීම් ප්‍රකාශයේ සඳහන් කර නොතිබුණි.

(ආ) 1999 හා 2010 වර්ෂවල සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් හා 2014 වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතුව තිබුණු එකතුව රු.146,072 ක ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.1, 4.2.4, 4.2.5 සහ 4.5 වගන්තිවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**3.3** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**3.3.1** **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------**

ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම් අතර වෙනසක් නිරීක්ෂණය වුවද, ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

**3.3.2 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් 2015 වර්ෂයේදී අභ්‍යන්තර විගණන කටයුතු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන අංශය සහායක නිලධාරින් දෙදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණු අතර අභ්‍යන්තර විගණකවරයෙක් පත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එය අක්‍රිය වී තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය කාර්යාල 16 කට අදාළ ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂාවලදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 214 | - | බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කර නොතිබුණි. |
| (ආ) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (i) 2015 මැයි 15 දිනැති අංක මු.අ 01/2015/01 දරන චක්‍රලේඛයේ 03(අ) ඡේදය. | 1,303,088 | විදේශගත වූ නිලධාරීයෙකු වෙත විදේශ රජය හෝ ප්‍රදාන ආයතනය විසින් අනියම් දීමනා නොගෙවන විටකදී පමණක් අනියම් දීමනා ගෙවිය හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී චීනයේ සංචාරය කළ නිලධාරීන් 11 දෙනෙකු සඳහා |

| | | | |
|---|---|---|---|
| | | | වියදම් වීන රජය විසින් සිදු කර තිබුණත්, දිනකට ඇ. ඩො.40 බැගින් රු.1,303,088 ක් අදාළ නිලධාරින්ට ගෙවා තිබුණි. |
| (ii) | 2001 ජූලි 02 දිනැති අංක 2001/03/එම්එෆ්/පීජ් 2 දරන චක්‍රලේඛය | - | පුහුණුව හා විදේශ සංචාරයට සහභාගි වී පැමිණි දින සිට සති 2 ක් ඇතුළත පුහුණුව හෝ විදේශ සංචාරයට අදාළව වාර්තාවක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු වුවත්, නිලධාරීන් 07 දෙනෙකු විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**3.6 කාර්යසාධනය**

**----------------**

2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්මේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කර්යයන්**

**--------------------------------------------------**

**ඩොප්ලර් රේඩාර් පද්ධතිය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඩොප්ලර් රේඩාර් පද්ධතියේ සියළු යාන්ත්‍රික සවි කිරීම් 2013 ඔක්තෝබර් 11 දින වන විටත් අවසන් කර තිබුණද, 2016 මාර්තු 23 දින වන විට එහි විදුලි ස්ථාපන කටයුතු ආරම්භ කර රේඩාර් පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබුණි. ඒ සඳහා රු. මිලියන 402.83 ක නිෂ්ඵල වියදමක් කර තිබුණි.

(ii) මේ පිළිබඳව සිදුකරන ලද පරික්ෂණවලින් රේඩාර් පද්ධතියේ සමහර අත්‍යවශ්‍ය කොටස් අළුත්වැඩියා කළ යුතුව තිබුණි. ඒ අනුව, එම කොටස් ගලවා පද්ධතිය ස්ථාපිත කර තිබුණු ගොන්ගල කඳු මුදුනේ සිට ගෙන්වා ගැනීමට කටයුතු කරමින් සිටින බව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි. මේ පිළිබඳව සිදුකරන ලද වැඩිදුර පරික්ෂණවලදී 2016 ජනවාරි 29 දින වන විට රු. මිලියන 9.15 ක් වටිනා උපකරණ 08 ක් පිටස්තර පාර්ශවයන් විසින් සොරකම් කර තිබුණු බව හෙළිදරව් වී තිබුණි.

(iii) රේඩාර් පද්ධතිය මිලදී ගැනීමට අදාළව ලෝක කාලගුණ විද්‍යා සංවිධානය හා ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් අමාත්‍යාංශය සමඟ වර්ෂ 05 ක් සඳහා අත්සත් කරන ලද භාරකාර අරමුදල් ගිවිසුම 2012 මැයි 23 දිනෙන් අවසන් වී තිබුණද, 2016 මාර්තු 23 දින වන විටත් නව ගිවිසුමකට අත්සන් කර නොතිබුණි.

(iv) මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබා ගත් වටිනාකම රු.මිලියන 142.68 ක් වූ රක්ෂණාවරණය 2014 මාර්තු 31 දින කල්පිරී තිබුණු අතර එහි දින දීර්ඝ කිරීමක් හෝ නව රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) මෙම පද්ධතිය ස්ථාපිත කර තිබුණු රේඩාර් මධ්‍යස්ථානය සඳහා වූ ගොඩනැඟිල්ල එහි කොන්ත්‍රාත්කරු වූ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් විධිමත්ව 2016 අප්‍රේල් 30 දින වන විටත් භාරදී නොතිබුණි.

**(ආ) ගොඩනැගිලි ඉදිකිරීම්**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **ත්‍රිකුණාමලය කාලගුණ විද්‍යා කාර්යාලය ඉදිකිරීම**

**---------------------------------------------------**

මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ත්‍රිකුණාමලය කාලගුණ විද්‍යා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් වූ අනුමත සැලැසුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

- මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කිරීමෙන් පසු විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි.

**(ii) නුවරඑළිය සංචාරක බංගලා භාරකරුගේ නිල නිවස ඉදි කිරීම**

**---------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් විස්තරාත්මක ඉංජිනේරු ඇස්තමේන්තුවක් ලබා නොගෙන උක්ත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.3,950,000 ක පිරිවැයකට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් වූ ගිවිසුම 2013 ජූලි 12 වන දින අත්සන් කර තිබුණු නමුත් එදිනට පෙර 2012 ඔක්තෝබර් 15 දින වන විට රු.1,975,000 ක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ඉදිකිරීම් කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණු නමුත් අතිරේක ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ඇස්තමේන්තුගත මුදල රු.5,445,000 දක්වා වැඩි කිරීමට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව එකඟවී තිබුණි.

- 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත කොන්ත්‍රාත් මුදල් පියවීමට නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් අතිරේකව රු.1,495,000 ක් ගෙවීමට සිදු වී තිබුණි.

**3.7** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 47 | 7 |
| (ii) | තෘතියික මට්ටම | 238 | 198 | 40 |
| (iii) | ද්විතියික මට්ටම | 29 | 8 | 21 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 139 | 116 | 23 |
| | **එකතුව** | **460** | **369** | **91** |